# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 19 - 2019 අගෝස්තු

## මැද කන්නයේ මුං අස්වැන්න නෙළීමට පහසු පිළිවෙතක්



අතීතයේ සිට ගොවියා රැකගෙන ආ යල මහ වශයෙන් අවුරුද්දකට කන්න දෙකක් වගා කිරීමේ පුරුද්ද කාලානුරූපීය නවීකරණයකට හසුවී තිබේ. මීට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක්කේ ක්‍රමයෙන් වගා බිම් සීමිත වීමත්, වැඩිවෙන ආහාර ඉල්ලුමත්ය. මේ නිසා ඉපනැල්ල සමග මාස දෙක තුනක් කුඹුර හුදකලා කිරීම යුගයේ හැටියට සාධාරණ වන්නේ නැත. කෙටිකාලීන බෝගයක් වගාකරන, අතරමැදි නොහොත් තුන්වෙනි කන්නයක් සඳහා ගොවීන් විසින් භූමිය සූදානම් කරන්නේ එබැවිනි. දිගින් දිගටම වී වගාකිරීම කෙරෙන ඉඩම් වල මෙසේ අතිරේක බෝගයක් වැවීම හැම අතින්ම සතුටුදායක පියවරකි. ඒ හරහා පාංශු මූලද්‍රව්‍යය ගොඩනැගීමක්, රෝග හා පළිබෝධකයින්ගේ ස්වභාවික පාලනයක්, ආදිය සිදුවෙන අතර ප්‍රධානතම ප්‍රතිලාභය වන්නේ ගොවි ජනතාවගේ අතමිට සරුකරන අතිරේක අස්වැන්නක් ඔහු වෙත හිමිවීමයි. මෙම අතරමැදි වගාවේ දී ගොවීන් වැඩි නැඹුරුතාවයක් පෙන්වන්නේ මුං වගාව කෙරෙහි බව සමීක්ෂණ ඇසුරෙන් පෙන්නුම් කර තිබේ. සීමිත කාලයක් තුළ වගාව අවසන් කිරීමට හැකිවීම, අස්වැන්න සඳහා ස්ථාවර මිලක් පැවතීම ආදිය නිසා ඔවුහු මුං වගාව කෙරෙහි වැඩියෙන් නැඹුරුවෙන නමුත්, අධික නිෂ්පාදන වියදම නිසාම ඇතැමුන් තුන්වෙනි කන්නය අතහැරීමට පවා පෙළඹෙමින් සිටී. නිෂ්පාදන වියදම වැඩිවීමට ප්‍රධාන හේතුවක් වන්නේ අස්වැන්න නෙළීමේ දී වැයවෙන, ඔරොත්තු නොදෙන කම්කරු ශ්‍රමයයි. වැඩි මිලක් ගෙවා හෝ කම්කරු ශ්‍රමය සපයා ගැනීමේ අපහසුතාවය ද මෙයටම බද්ධව පවතී.



මෙය අවධානයට ගත් පර්යේෂකයින් මුං අස්වැන්න නෙළීම සඳහා යාන්ත්‍රීකරණය හඳුන්වාදීමට උත්සාහ කළ අතර එතැන දී ඔවුන් මුහුණදුන් අභියෝගය වූයේ ඒකාකාරීව පත්‍ර වියැලුණු වගාවක් බිහිකර ගන්නේ කෙසේ ද යන්නයි. කෙතක ගොයම පැසෙනවා සේ මුං බෝගයේ පත්‍ර වියළී යන්නේනම් සංයුක්ත අස්වැන්න නෙළනයක් මඟින් හෝ අතින් බෝගය කපා පසුව කොළමඩින යන්ත්‍රයකින් ඇට වෙන්කරගැනීමක් හෝ සිදුකළ හැකිය. ලුණු ද්‍රාවණයක් පත්‍ර මත ඉසීමෙන් අවශ්‍ය වෙලාවට ඒකාකාර පත්‍ර වියළීමක් ලබාගැනීමට දැරූ උත්සාහයන් සාර්ථක වී තිබෙන බව පසුගියදා පැවති තාක්ෂණ නිර්දේශ කිරීමේ කමිටුව හමුවේ ඉදිරිපත් වූ වාර්තාවකින් කියැවුනි. එම්.අයි. 6 නම් මුං ප්‍රභේදය භාවිතා කර මෙම අධ්‍යයනය සිදුකර තිබේ.

පත්‍ර වියළීයාමට හෝ හැලීයාමට උචිත සෝඩියම් ක්ලෝරයිඩ් නොහොත් සාමාන්‍ය ලුණු වල, සාන්ද්‍රණය නිර්ණය කිරීමේ හා එය යෙදිය යුත්තේ කුමන මට්ටමකට පැසුණු බෝගයකටදැයි සෙවීමේ පර්යේෂණ සිදුකර ඇත්තේ අඟුණකොළපැලැස්ස මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ දීය. මහඉලුප්පල්ලම පර්යේෂණායතනයේ දී අස්වැන්න නෙළනා යන්ත්‍රයේ කලයුතු සීරුමාරු කිරීම් ගැන හදාරා තිබේ. මීට අමතරව ඔක්කම්පිටිය ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍රයන්හි කෙරුණු වැඩසටහන් හරහා මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම ව්‍යාප්ති අංශය හා ගොවි ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.



සාමාන්‍යයෙන් ගොවීන් විසින් මුං අස්වැන්න නෙළනු ලබන්නේ දෙවරකි. සුළු පරිමාණයෙන් ගෘහාශ්‍රිත වගාවක් ලෙස පවත්වාගන්නේ නම් පමණක් වාර ගණන මීට වඩා වැඩිවිය හැක්කේ, භූමිය වෙනත් වගාවක් වෙනුවෙන් සූදානම් නොකොට මුං වගාවම දිගටම පවත්වාගෙන යන විටදීය. පළමු නෙළීමේ අවධියේ දී කරල් හොඳින් කළුපැහැ වනතෙක් මේරීමට තබා ලුණු ද්‍රාවනය ඉසින්නේ නම් වාර දෙකේම හානියකින් තොරව අස්වැන්න ලබාගත හැකිය. මන්දයත් පත්‍ර වියළෙන විට, දෙවන නෙළීමට හසුවෙන කරල් ද හොඳින් මෝරා තිබීම නිසාය.

බෝගයට යෙදිය යුතු ලුණු මාත්‍රාව වන්නේ ලීටරයට ග්‍රෑම් 35-40 ක ප්‍රමාණයකි. නැප්සැක් ඉසින යන්ත්‍රයක් භාවිතා කරන්නේ නම්, එහි මුළු පරිමාව වන ලීටර් 16 සඳහා ග්‍රෑම් 600 ක් සෑහෙනු ඇත. සියුම්ව බිංදු විසිරෙන නොසලයක් ආධාරයෙන් මුං ශාක පත්‍ර තෙමෙන සේ දියරය ඉසිය යුතු අතර පත්‍ර වලින් ලුණු ද්‍රාවනය බේරෙන තෙක් ඉසීම අවශ්‍ය නොවේ. යෙදිය යුත්තේ එකවරකි. පළල් පත්‍ර සහිත වල්පැළෑටි වලට වල්නාශක යොදන පිළිවෙලටම ලුණු ද්‍රාවනය ඉසීම සෑහේ. බෝගයේ පත්‍ර වැඩිනම් ලුණු ද්‍රාවණය වැඩිපුර වැයවෙනු ඇත. දින 3-4 ගතවෙත් දී පත්‍ර වියළී යන නිසා දෑකැත්තෙන් කපා කොළ මඩින යන්ත්‍රය හරහා හෝ සෘජුවම සංයුක්ත නෙළනයෙන් හෝ අස්වැන්න සකසාගත හැකිවේ.

ලුණු ද්‍රාවණය ඉසීම සඳහා පර්යේෂකයින් නිර්දේශ කරනුයේ ප්ලාස්ටික් වලින් තැනූ දියර ඉසිනයන්ය. ලුණු හමුවේ ලෝහ ටැංකි ඉක්මනින් දිරා යා හැකි නිසාය. ලුණු යෙදීම නිසා පසෙහි ලවණ ගොඩනැගීමක් සිදුවේ ද යන්න පිළිබඳවත් අවධානය යොමුකර තිබේ. සරලව පැවසිය හැක්කේ ලුණු ඉසින්නේ වගාවේ පත්‍ර මතට නිසාත්, බොහොමයක් පත්‍ර භූමියෙන් ඉවත්වෙන නිසාත් ගැටළුවක් ඇති නොවන බවයි. එසේවුවත් කරුණු තහවුරු කරගැනීම උදෙසා, යොදන ලුණු ප්‍රමාණයට අදාළ මාත්‍රාවක් ක්ෂේත්‍රයේ පසට යොදා පසෙහි පී.එච්. අගය හා අයන හුවමාරු ධාරිතාව පරීක්ෂාකර බලා ඇත. වෙනසක් වාර්තා නොවුන බව පර්යේෂකයෝ පෙන්වා දෙති. මේ නිසා කන්නයට අනුව කෙරෙන මුං වගාවකට වුවත් ලුණු ඉස, පත්‍ර වියළා දැමීම සාර්ථක ක්‍රමවේදයක් බව පෙනේ. අතරමැදි කන්නයේ නම් භූමියකට මෙම ලුණු ප්‍රමාණය වගාවේ පත්‍ර මතට හෝ වැටෙන්නේ වසරකට එක වතාවකි. අනෙක් කාලයේ දී මේ භූමියේ කෙරෙන්නේ ජලය බහුලව යොදා ගැනෙන වී වගාවයි. ඒ නිසා ලවණ ගොඩනැගීමක් ගැන ගොවි ජනතාව සිතිය යුතු නැත.

අස්වැන්න නෙළීමේ නිෂ්පාදන වියදම නිසාම ගොවියා මුං වගාවෙන් ඉවත්වීමට සූදානම් වන මොහොතක දී ඒ සඳහා සාර්ථක විසඳුමක් ඉදිරිපත් කළ මෙම පර්යේෂණ වාර්තාවට තාක්ෂණ නිර්දේශ කිරීමේ කමිටු රැස්වීමේ දී අනුමැතිය හිමිවිය.

**පිටපත : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**

**තාක්ෂණික කරුණු : නිලූකා ගුණතිලක - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ - ශෂ්‍ය විද්‍යා)**

**මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැළැස්ස**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)